# අක්කා නගෝ



චමත්කා පැහැසරණී

කතෘගේ නම : චමත්කා  පැහැසරණී

කෘතියේ නම : අක්කා නගෝ

කතෘගේ වෙනත් කෘති :මගේ කතන්දර පොත

කෘතිය පළ කරන දිනය : 2025.02.08

මෙම පොතෙහි සම්පූර්ණ අයිතිය කතෘ වන චමත්කා පැහැසරණී සතුය.

ISBN අංකය: 978-624-208-651-4

# පිදුම

***මෙම පොත සෑදීමට මා හට උපකාර කළ***
***සැමට මේ පොත පුද කර සිටිමි.***

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය.එසේනම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගනණාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදු වීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිපලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය ,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

"අම්මා !!! අනේ මාව බේර ගන්න..අක්කා මාව මරන්න හදන්නේ . ආ...."

මේ කෑගැහිල්ල නම් මේ ගෙදරට නුපුරුදු සද්දයක් නෙවෙයි.ඒ නිසාම තමයි වලස් අම්මා කිසි කලබලයක් නැතුවම සද්දෙ ඇහුණු තැනට ආවේ.

අම්මා එද්දිත් වලස් නංගි බිම වැටීගෙන ලොකු රංගනයක. අම්මා ආපු ගමන් නංගිගෙ සද්දෙ තවත් වැඩි වුණා.

"අක්ක මට මේ මී වදය කන්න දුන්නෙ නෑ.මම ටිකක් ඉල්ලුවාම මාව බිමට තල්ලු කළා.මගේ කොන්ද කැඩුනද දන්නෙ නෑ."

වලස් නංගි එක හුස්මට කිව්වා.

"ලොකු දුව ඇයි නංගිව තල්ලු කලේ.මේ පොඩි ළමයට පොඩ්ඩක් හරි ආදරය කරන්නකෝ"

අම්මා  වලස් අක්කාට කිව්වා.

"අම්මෙ මෙයා බොරු කියන්නේ.මම මීවද කෑල්ලක් දෙන්න බෑ කිව්වා කියලා එක පරටම බිම වැටිලා මම මෙයාව මරන්න හදනව කියලා කෑ ගහන්න පටන් ගත්තා...මම එයාට ගැහුවෙ නෑ."
වලස් අක්කා කිව්වා .

"ආයෙ එහෙම නංගි එක්ක රණ්ඩු වෙලා තිබ්බොත් බලාගෙනයි.දැන් මේ මී වදය බෙදාගෙන කන්න"



වලස් අම්මා අක්කටයි නංගිටයි මී වදය බෙදලා දීලා එතනින් යන්න ගියා.

අම්මා  ගියපු ගමන් වලස් නංගි චුටි කපටියෙක් වගේ අක්කාට විරිත්තලා හිනා වුණා. වලස් අක්කාට හොඳටම තරහ ගියා.කැලේ ඉන්න අක්කලා අයියලා හැමෝටම ලොකු මාර ගහ ළඟට එන්න කියලා පණිවිඩයක් යැවුවා.

නංගිලා මල්ලිලාගෙ නපුරු වැඩ නිසා අගතියට පත්  අක්කලා අයියලා හැමෝම එතනට ඇවිත් හිටියා.

"අපි අද මෙතනට එකතු වෙලා ඉන්නේ කරදරකාර නංගිලා මල්ලිලාගෙන් ගැලවෙන්න විදිහක් හොයා ගන්න..මේ කරදරකාරයින්ට පාඩමක් උගන්නන්න විදියක් හැමෝම හිතල කියන්න"

වලස් අක්කා කිව්වා .

"අපි මේ කරදර කාරයින්ව කැලේ මැද ලොකු වලක් හාරලා ඒකට දාල වහමු."

හා පැංචි කිව්වා .

"අප්පෝ බෑ ....එයාලට මොකක් හරි කරදරයක් වුනොත්"

වලස් අක්කා ඒකට කැමති වුනේ නෑ .

" අපි එයාලව කැලේ අතරමං කරමු"

නරි අක්කා කිව්වා..

කැලේ අක්කලා අයියලා හැමෝම ඒකට
එකඟ වුණා .



කතා කර ගත්ත විදිහට හැමෝම තමන්ගෙ නංගිලා මල්ලිලා හැමෝම එක්කගෙන කැලේ මැද්දට ආවා.

"අපි හැංගිමුත්තන් කරමු...නංගි බබාලයි මල්ලි බබාලයි හැංගෙන්න ....අපි හොයන්නම්."

අක්කලා කියපු විදිහට නංගිලා මල්ලිලා හැංඟුනා.එයාලා හැංගෙනකන් හිටපු අක්කලයි අයියලායි ආපහු තමන්ගේ ගෙවල් වලට ගියා ...

හොදටම හවස් වුණා..අම්මලා තාත්තලා හැමෝම බයවෙලා නංගිලාවයි මල්ලිලාවයි හොයන්න පටන් ගත්තා.අම්මලා කෑ ගහල ඇඩුවා.

ඒක දැකපු අක්කලා ,අයියලා හැමෝටම දුක හිතුනා.තමන්ගේ සහෝදර සහෝදරියන් නැතිව පාළු හිතුණා..

ඒ නිසා ඉක්මනින් කැලේට ගිහින් තමන්ගෙ පොඩි සහෝදර සහෝදරියන් ආපහු ගෙදරට එක්කරගෙන ආවා..

"අපිට සමාවෙන්න අපිට කොච්චර කරදර කරත් අපි ඔයාලා ට හරිම ආදරෙයි...අපිට ඔයාල නැතුව ඉන්න බෑ."

අක්කලයි අයියලායි කිව්වා...

*"අපිත් ආයේ ඔයාලට කරදර කරන්නේ නෑ...අම්මලාට කියල ගුටි ගස්සන්නෙත් නෑ ...අපිත් ඔයාලට හරිම ආදරෙයි"*

*නංගිලා මල්ලිලා ත් තම තමන්ගෙ වැරදි තේරුම් ගත්තා....*

*නංගිලා මල්ලිලා අක්කලා අයියලා ට චූටි චූටි කරදර කරන්නේ ආදරේ ට කියල දැන් ඔයාලටත් තේරෙනවා නේද ?*



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත් ,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ,දියණියන් ,ගුරු භවතුන්,දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම

*සමාජය තුල විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.*

*මෙයට පිලියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනය කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ.තම නිසඟ,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංශන.*

*ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,*

*සෙනෙවිරත්න මහලේකම් .*

ISBN අංකය: 978-624-208-651-4